# රූකඩ කලාව

## 7 ශ්‍රේණිය



LIVEWORKSHEETS

# රූකඩ කලාව

- රූකඩ කලාව ළමුන්ට මෙන්ම වැඩිහිටියන්ට ද රසාස්වාදයක් ගෙන දෙන සුවිශේෂ කලා අංගයක් වේ.
- රූකඩ කලාව ලංකාවේ අතීත සංස්කෘතික උරුමයක් සේ ම වර්තමානයේ ප්‍රාසාංගික කලාවක් ලෙස වර්ධනය වී ඇති ජනප්‍රිය කලා නිර්මාණ ලෙස හඳුනා ගත හැකි වේ.
- නිර්මාණය සඳහා භාවිත කරන මාධ්‍ය හා ක්‍රියාකරවීමේ ස්වභාවය අනුව රූකඩ වර්ග කර ඇති ආකාරය හඳුනා ගත හැකිය. ඒ අනුව ඉතා ජනප්‍රිය රූකඩ වර්ග 05ක් පහතින් දැක්වේ.



i.නූල් රූකඩ



ii. අත් රූකඩ



iii.සෙවනැලි රූකඩ




iv.රිටි රූකඩ



v.ඇඟිලි රූකඩ

LIVEWORKSHEETS

- රූපවාහිනී මධ්‍ය තුල අති රූකඩ හා රිටි රූකඩ ඉතා ජනප්‍රිය වී ඇත.
- නූල් රූකඩ කලාව ශ්‍රී ලංකාවේ පාරම්පරිකව පැවත එන ජන කලාවකි.
- විවිධ ඓතිහාසික හා කාලීන කතා වස්තුව හා සිද්ධිවලට ඇතුළත් චරිතයක් රූකඩ මගින් නිර්මණය කරයි.
- රූකඩ නාට්‍යය ලංකාවේ අතීතයේ සිට පැවත එන කලාවකි. මෙම නාට්‍ය නූල් රූකඩ ඇසුරෙන් නිර්මාණය කල ඇත.
- රූකඩ නාට්‍ය සඳහා යොදා ගන්න ඓතිහාසික නාට්‍ය අතර ඇහැලේපොළ, සිරිසඟබෝ, අජාසත්ත, කාලගෝල, පටාචාරා, අංගුලිමාල කතාව හා වෙස්සන්තර ජාතකය වැනි කතාව සුවිශේෂ වේ.



නූල් රූකඩ ඇසුරින් රඟ දක්වන ඇහැලේපොළ කතාවේ අවස්ථාවක්

LIVEWORKSHEETS

- වෙසක්, පොසොන් හා ගම්මඩු වැනි ආගමික උත්සව අවස්ථාවන්හි දී රූකඩ සංදර්ශන පැවැත්වීම අතීතයේ සිට ග්‍රාමීය ප්‍රජාව විසින් සිදුකරන ලද්දකි.

- පසුබිම් සංගීතය, ගීතය, දෙබස්, ආලෝකකරණය යන අංග රූකඩ නාට්‍ය නිර්මාණවල ගුණාත්මක හා කලාත්මක වර්ධනය සඳහා වැදගත් වේ.

- රූකඩ නාට්‍ය සඳහා බොහෝ විට ගායනා කරනු ලබන්නේ නූර්ති හා නාඩගම් ගීතයි. ගායනය හා දෙබස් කීම බොහෝ විට රූකඩ නාට්‍යයේ ශිල්පීන් විසින්ම සිදුකරනු ලබයි.

- රූකඩ නාට්‍ය සඳහා විශේෂ වේදිකා නිර්මාණ හා පසුතල නිර්මාණයද සකස් කෙරේ. මෙම වේදිකාව ඉතා කුඩා වන අතර, ඒවා ඇස්මට්ටමින් ඉහළ සකස් කෙරේ.

- රූකඩ නිර්මාණය සඳහා විවිධ ද්‍රව්‍ය භාවිතා කෙරේ. ප්‍රධාන වශයෙන් දැව භාවිතා කෙරන අතර, ඒ සඳහා කදුරු ලී හෝ රුක්අත්තන ලී උපයෝගි කර ගනී. ඊට අමතරව රෙදි, නූල්, යකඩ, ඇණ, බයිසිකල් ටියුබ් කැබලි භාවිතා කරයි.

- නූල් රූකඩයක කොටසක් සම්බන්ධය සිදුකරනු ලබන්නේ අත්, පා, හිස චලනය වන ආකාරයෙනි. ඒ සඳහා බයිසිකල් ටියුබ් කැබලි භාවිතය කරයි.

- අත් රූකඩ ඉතා සරල ද්‍රව්‍ය භාවිතයෙන් නිර්මාණය කළ හැකි වේ. රෙඹි කැබලි, අත් මේස්, බොත්තම්, පබළු, නූල්, මැලියම්, කම්බි, වැනි විවිධ ද්‍රව්‍ය මේ සඳහා භාවිතා කළ හැකි වේ.

LIVEWORKSHEETS

## ක්‍රියාකාරකම 01

01.රූකඩ නාට්‍ය සඳහා බොහෝ විට ගායනා කරනු ලබන ගීත මොනවාද?

02.රූකඩ නාට්‍ය සඳහා භාවිතා කරන ද්‍රව්‍ය 5 නම්කරන්න.

## ක්‍රියාකාරකම 02

මෙය මත CLICK කරන්න

LIVEWORKSHEETS